# XV වන පරිච්ඡේදය

## වෘත්තීය සංගම් සාමාජිකයන් සඳහා අනුග්‍රහ

1. සාමාජිකයන්ගේ දායක මුදල් ඔවුන්ගේ පඩිපතින් අඩුකර ගැනීම
2. වෘත්තීය සංගම් කටයුතු / වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා රාජකාරී නිවාඩු සහ ප්‍රවාහන පහසුකම්
3. වෘත්තීය සංගම් සඳහා කාර්යාල පහසුකම් ලබා දීම
4. වෘත්තීය සංගම් රැස්වීම්
5. වෘත්තීය සංගම් නිලධාරීන් ස්ථාන මාරු කිරීම
6. චක්‍රලේඛවල පිටපත් ලබාදීම
7. ලියාපදිංචි වෘත්තීය සංගම්

## XV වන පරිච්ඡේදය

### වෘත්තීය සංගම් සාමාජිකයන් සඳහා අනුග්‍රහ

**1. සාමාජිකයන්ගේ දායක මුදල් ඔවුන්ගේ පඩිපතින් අඩුකර ගැනීම**

1.1 කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි / විද්‍යායතනයන් හි සේවයේ නියුතු ලියාපදිංචි වෘත්තීය සංගමයක සාමාජිකත්වය දරන සාමාජිකයන්ගේ දායක මුදල් ඔවුන්ගේ පඩිපතින් අඩුකොට, අදාල වෘත්තීය සංගමය වෙත යැවිය හැකි ය. — පඩිපතින් අඩුකර ගැනීම

1.2 මෙම කාර්යය සඳහා තම පඩිපතින් දායක මුදල් අයකර ගැනීමට කැමැත්ත පළ කරමින්, සාමාජිකයින් විසින් අත්සන් කරන ලද කැමැත්ත පළ කිරීමේ ආකෘති පත්‍ර, අදාල වෘත්තීය සංගමය විසින්, කොමිෂන් සභාවේ නම් එහි ලේකම්වරයාට / විශ්වවිද්‍යාලයක නම් එහි ලේඛකාධිකාරීවරයාට / විශ්ව විද්‍යාල විද්‍යායතනයක නම් එහි ලේකම්වරයාට සහ මණ්ඩපයක, ආයතනයක, මධ්‍යස්ථානයක ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධරයාට ලබාදිය යුතු ය. එසේ ලබාදෙන කැමැත්ත පළ කිරීමේ ආකෘති පත්‍ර අදාල සාමාජිකයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ බහා තැබිය යුතු ය. — කැමැත්ත පළ කිරීම

1.3 වෘත්තීය සංගමයක සාමාජිකයකු උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සිට තවත් උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් වෙත හෝ කොමිෂන් සභාවෙන් හෝ කොමිෂන් සභාවට ස්ථාන මාරුකල විට, එසේ ස්ථාන මාරුවීම් ලබා ඇති උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යායතනයේ /කොමිෂන් සභාවේ මුල්‍යාධිකාරීවරයාට/ භාණ්ඩාගාරිකවරයාට / ගණකාධිකාරීවරයාට, එම සාමාජිකයා විසින් තම පඩි පතින් වෘත්තීය සංගමයේ දායක මුදල් අයකර ගැනීමට කැමැත්ත පළ කොට ඇති බව දන්වා එසේ අයකර ගත යුතු මුදල් ප්‍රමාණය ගැන ද, අදාල අයකිරීම් ලැයිස්තුවේ සටහනක් තැබිය යුතු ය. — ස්ථාන මාරුකල විට

1.4 වෘත්තීය සංගම් සාමාජිකයකු, තමා එසේ කලින් දී ඇති කැමැත්ත, ලිඛිතව දැනුම් දීමෙන් අනතුරුව අවලංගු කිරීමට හැකියාව තිබේ. එසේ තමන් දී ඇති කැමැත්ත අවලංගු කිරීමේ ලිපිය, අදාල වෘත්තීය සංගමය මාර්ගයෙන් ඒවා නොමැති විට, කැමැත්ත අවලංගු කරගෙන ඇති බවත්, දායක මුදල් අයකර ගැනීම නවත්වන්නේ කවර මාසයක සිට ද යන්න ගැනත්, එකී වෘත්තීය සංගමයට ගෙවීම් කරන නිලධාරියා විසින් ලිඛිතව දැන්විය යුතු ය. එවැනි අවලංගු කිරීම් සම්බන්ධයෙන් ක්‍රියා නොකරන ලෙස වෘත්තීය සංගම් මගින් කරනු ලබන අභියාචනා කුමන හෝ හේතුවක් මත සළකා බලනු නො ලැබේ. — කැමැත්ත අවලංගු කිරීම

1.5 මාස්පතා අයකරගනු ලබන දායක මුදල් පිළිබඳ විස්තර ඇතුලත් උපලේඛනයන් සැම මසකම දහ වැනි (10) දිනට — මාසිකව දායක මුදල් අයකර ගැනිම

ප්‍රථමයෙන් වෘත්තීය සංගම් විසින් අදාල ගෙවීම් කරන නිලධාරියාට, එනම් කොමිෂන් සභාවේ ගණකාධිකාරීවරයාට / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක මූල්‍යාධිකාරීවරයාට, භාණ්ඩාගාරිකවරයාට ආදි වශයෙන් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු ය. එම ලේඛනයේ එක් පිටපතක් තමන් වෙත රඳවා ගෙන අනෙක් පිටපත අදාල වෘත්තීය සංගමය වෙත ගෙවූ මුදල ද සමඟ එම නිලධාරීන් විසින් ආපසු යවනු ඇත.

1.6 එම ආකාරයටම, දායක මුදල් ත්‍රෛයි මාසිකව, අර්ධ වාර්ෂිකව හෝ වාර්ෂිකව අය කරගන්නා විට, අය කිරීම් පිළිබඳ උපලේඛනය, දායක මුදල් ගෙවිය යුතු මුල් මාසයේ හත් වැනි (07) දිනයට පෙර අදාල පරිදි ගණකාධිකාරී / මූල්‍යාධිකාරී / භාණ්ඩාගාරික හට ලැබීමට සැලැස්විය යුතු වේ.

ත්‍රෛයි මාසිකව, අර්ධ වාර්ෂිකව, වාර්ෂිකව දායක මුදල් අයකර ගැනීම

1.7 එක් එක් සාමාජිකයාගේ දායක මුදල් ඔවුන්ගේ පඩි පතින් අඩුකර ගනු ලබන්නේ, VI වැනි පරිච්ඡේදයේ 28 වැනි ඡේදයෙහි සඳහන් නියමයන්ට යටත්ව ය.

අය කර ගැනිමේ සීමාවන්

## 2. වෘත්තීය සංගම් කටයුතු / වාර්ෂික මහා සභා රැස්වීම් සඳහා රාජකාරී නිවාඩු සහ ප්‍රවාහන පහසුකම්

වෘත්තීය සංගම් කටයුතු සඳහා හෝ යම් වෘත්තීය සංගමයක වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීම සඳහා ගමන් කිරීමට අදාලව රාජකාරී නිවාඩු ලබාදීම සහ රාජකාරී දුම්රිය ගමන් බලපත්‍ර නිකුත් කිරීම, X වන පරිච්ඡේදයේ 19 වැනි ඡේදයෙහි සහ XIII වන පරිච්ඡේදයෙහි 1.7 උපඡේදයෙහි සඳහන් නියමයන්ට අනුව සිදුකල යුතු වේ.

රාජකාරී දුම්රිය ගමන් බලපත්‍ර

## 3. වෘත්තීය සංගම් සඳහා කාර්යාල පහසුකම් ලබා දීම

3.1 ආයතනයේ එදිනෙදා අධ්‍යයන සහ පරිපාලන කටයුතු වලට බාධාවක් නොවන පරිදි ඉඩ පහසුකම් සැපයිය හැකි නම්, කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යාතනයක් විසින් එහි සේවකයින්ගේ ලියාපදිංචි වෘත්තීය සංගම් සඳහා කාර්යාලයක් ලෙස භාවිතා කිරීමට ඉඩ පහසුකම් සැලැස්වීමට කටයුතු කළ හැකි ය. එසේ ලබා දී ඇති කාර්යාල පහසුකම, කොමිෂන් සභාව සහ එක් එක් උසස් අධ්‍යාපන ආයතනයේ/ විද්‍යායතනයේ සෑම වෘත්තීය සංගමයක් විසින් ම සහයෝගයෙන් පරිහරණය කළ යුතු වේ.

කාර්යාල පහසුකම් ලබා දීම

3.2 එවැනි කාර්යාල පහසුකම් සපයා දීමෙන් පසුව වුව ද, එම ඉඩ ප්‍රමාණය කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක රාජකාරී කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, අදාල ආයතනය විසින් වෘත්තීය සංගමය නිසි පරිදි දැනුවත් කිරීමෙන් අනතුරුව, කාර්යාලය සඳහා වෙන් කොට ඇති ඉඩ ප්‍රමාණය නැවත ආයතනය වෙත ලබා ගත හැකි ය.

ආපසු පවරා ගැනීමට යටත්ව ය

4. **වෘත්තීය සංගම් රැස්වීම්**

කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවකයින්ගේ ලියාපදිංචි වෘත්තීය සංගමයකට, රැස්වීම් පැවැත්වීම සඳහා එම කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ භූමිය හෝ ගොඩනැඟිලි පහත සඳහන් කොන්දේසි වලට යටත් ව භාවිතා කළ හැකි ය.

රැස්වීම් පැවැත්වීමට අවසරය ලියා පදිංචි වෘත්තීය සංගම් වලට පමණි

4.1 තම වෘත්තීය සංගමයේ රැස්වීමක් කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක භූමියේ හෝ ගොඩනැඟිල්ලක පැවැත්වීම සඳහා එම වෘත්තීය සංගමයේ සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින්, අදාල පරිදි කොමිෂන් සභාවේ ලේකම්වරයාගෙන් / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයාගෙන් / මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයාගෙන්/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයාගෙන් / උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක, මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයාගෙන් අවසර ලබා ගත යුතු ය.

අවසර ලබා ගැනීම

4.1.1 එවැනි රැස්වීම්ක් සාමාන්‍ය කාර්යාල වේලාවන් තුල දී හෝ අධ්‍යයන කටයුතු පැවැත්වෙන අවස්ථාවන්හි දී පැවැත්වීමට යෝජනා කරන්නේ නම්, ඒ සඳහා අවසර ලබා නොදිය යුතු ය. එහෙත්, යම් විශේෂිත හේතුවක් නිසා, වෘත්තීය සංගම් රැස්වීම්ක් ඉහත සඳහන් වේලාවන් තුල දී පැවැත්වීම අවශ්‍ය වන්නේ නම්, ඒ සඳහා අවසරදී ම කොමිෂන් සභාවේ සභාපතිවරයා / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියා යන නිලධාරීන් පෞද්ගලිකව සෑහීමට පත්වීම මත විය යුතු ය.

කර්යාල වේලවන් තුල දී නොවිය යුතු ය

4.1.2 රැස්වීම්ක් පැවැත්වීම සඳහා කරනු ලබන ඉල්ලීම්, එම රැස්වීම් පැවැත්වීමට යෝජිත දින ට, යටත් පිරිසෙන් දින හතරකට (04) හෝ පෙරාතුව අදාල නිලධරයන් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

රැස්වීම් ගැන දැනුම් දීම

4.2 එවැනි රැස්වීම්කට, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනය/ විද්‍යායතනයක සේවකයින් නොවන වෙනත් තැනැත්තන් පැමිණෙන්නේ නම්, රැස්වීම් පැවැත්වීමට යටත් පිරිසෙන් සතියකට කලින් එම තැනැත්තන්ගේ නම් සහ වෙනත් අවශ්‍ය තොරතුරු කොමිෂන් සභාවේ ලේකම්වරයා මාර්ගයෙන් / විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා මාර්ගයෙන් / විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ලේකම්වරයා මාර්ගයෙන් / මණ්ඩපයක, උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක ජ්‍යෙෂ්ඨතම පරිපාලන නිලධරයා මාර්ගයෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා වෙත ඉදිරිපත් කොට අදාල ආයතනය වෙත එම තැනැත්තන් හට පැමිණීම සඳහා අවසර ලබා ගත යුතු වේ.

බාහිර පුද්ගලයින්ගේ පැමිණීම සඳහා අවසර ගැනීම

4.3 යම් වෘත්තීය සංගම් රැස්වීම්ක් පැවැත්වෙන විට, ඊට අදාල පොස්ටර් සහ දැන්වීම් ආයතනයේ බිත්ති මත නො අලවන බවටත්, ආයතනයේ වෘත්තීය සංගමයේ සභාපතිවරයාගේ සහ ලේකම්වරරයාගේ වගකීම වන්නේ ය. එසේ ආයතනයේ

ගොඩනැගිලි විරූපවන අන්දමේ කටයුතු නොකරන බවට වග බලා ගැනීම

ගොඩනැගිල්ලකට හෝ භූමියට යම් හානියක් වී ඇත්නම්, ඒ පිළිබඳ වගකීම අදාල වෘත්තීය සංගමයේ සභාපතිවරයා සහ ලේකම්වරයා වෙත පෞද්ගලිකව ම පැවරෙනු ඇත.

## 5. වෘත්තීය සංගම් නිලධාරීන් ස්ථාන මාරු කිරීම

5.1 කොමිෂන් සභාවේ /උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ලියාපදිංචි වෘත්තීය සංගමයක, මව් සංවිධානයක ප්‍රධාන නිලතල උසුලන නිලධාරීන්, එකී සංගම්වල වැඩ කටයුතු කර ගැනිමේ පහසුව උදෙසා, ඔවුන්ගේ සේවය අවශ්‍යවන ආයතනයක් වෙත පත්කල යුතු වේ. ඔවුන් සාමාන්‍ය ස්ථාන මාරුකිරීම් රීතිවලට අනුව මාරුකිරීම් සඳහා යටත් නොවෙති. මෙම පහසුකම ලබා ගැනීමට අදහස් කරන වෘත්තීය සංගම් විසින්, කොමිෂන් සභාවේ ලේකම්වරයා මඟින් එහි සභාපතිවරයා හට ද/ විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරයා මඟින් එහි උපකුලපතිවරයා හට ද/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා මඟින් එහි අධ්‍යක්ෂවරයා වෙත ද/ මණ්ඩපයක, උසස් අධ්‍යාපනය පිළිබඳ ආයතනයක, මධ්‍යස්ථානයක ජ්‍යෙෂ්ඨතම පරිපාලන නිලධරයා මඟින්, එහි මණ්ඩපාධිපතිවරයා/ අධ්‍යක්ෂවරයා වෙත ද අදාල වෘත්තීය සංගම් නිලධාරීන්ගේ නම් සහ ඔවුන් උසුලන තනතුරු ද, අදාල වෘත්තීය සංගමයේ සාමාජික සංඛ්‍යාව ද, එම තැනැත්තන් මාරුකල යුතු ආයතනයේ නම ද ඇතුලත් කොට ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු වේ.

ප්‍රධාන නිල තල දරන්නන්

5.2 මෙම අනුග්‍රහය ලබාදිය යුතු, වෘත්තීය සංගමයක ප්‍රධාන නිලතල උසුලන තැනැත්තන්ගේ නම් සහ තනතුරු ද, ඒ ඒ වෘත්තීය සංගමයේ සාමාජික සංඛ්‍යාව ද, ඔවුන් පත්කල යුතු ආයතනය ද, කොමිෂන් සභාවේ ලේකම්වරයා / විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා / විශ්වවිද්‍යාල විද්‍යායතනයක ලේකම්වරයා / මණ්ඩපයක, උසස් අධ්‍යාපන ආයතනයක / මධ්‍යස්ථානයක ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධරයා සහ අදාල වෘත්තීය සංගම් විමසීමෙන් අනතුරු ව, කොමිෂන් සභාවේ සභාපතිවරයා / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධරයා විසින් නිගමනය කරනු ලැබේ.

5.3 මෙම අනුග්‍රහය යටතේ කිසියම් ආයතනයකට පත් කරනු ලැබූ වෘත්තීය සංගම් නිලධරයකු, ඔහු එම තනතුර තවදුරටත් නො උසුලන විට, සාමාන්‍ය මාරු කිරීම් රීතී යටතේ ස්ථාන මාරු කිරීමට යටත් වේ.

තනතුර අවසන් වූ පසු සාමාන්‍ය පරිදි මාරු කිරීම

5.4 මෙම අනුග්‍රහය දෙනු ලබන්නේ, සේවා අවශ්‍යතාවයන්ට සහ විනය ක්‍රියාපරිපාටියට ද යටත්ව ය.

මෙම පහසුකම කොන්දේසි වලට යටත් ව ය

## 6. චක්‍රලේඛවල පිටපත් ලබාදීම

කොමිෂන් සභාව විසින් / උසස් අධ්‍යාපන ආයතනයක් / විද්‍යායතනයක් විසින් නිකුත් කර ඇති, වෘත්තීය සංගම් වලට අදාල යැයි සළකනු ලබන්නා වූ චක්‍ර ලේඛයක පිටපතක් බැගින් ලියාපදිංචි වී ඇති වෘත්තීය සංගමයක මව් සංවිධානයට සහ උසස් අධ්‍යාපන ආයතනයන් හි තිබෙන ශාඛා සංගම් වෙත ද ලබාදිය යුතු ය.

6.1 රහස්‍ය භාවයෙන් යුතු චක්‍ර ලේඛයන් හි පිටපත් වෘත්තීය සංගම් වෙත ලබා නොදිය යුතු ය. රහස්‍ය චක්‍රලේඛ

7. මෙම පරිච්ඡේදයේ කාර්යයන් සඳහා "ලියාපදිංචි වෘත්තීය සංගමය " යන්නෙන් අදහස් වන්නේ, වෘත්තීය සංගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති, කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයන්හි / විද්‍යායතනයන්හි සේවකයින්ගෙන් සැදුම්ලත් සංගමයකි. ලියාපදිංචි වෘත්තීය සංගමය